කථිකාචාර්ය,
පූජ්‍ය ඉලුක්කේවෙල ධම්මරතන හිමි,
B.A. Hons. (BPU), M.A., MPhil. (PGIPBS)
බෞද්ධ දර්ශන අධ්‍යයනාංශය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

## පෘතජ්ජන සිතෙහි ප්‍රභාශ්වර බව

ලෝභ, දෝස හා මෝහ අකුසල මූලයන් වන අතර අලෝභ, අදෝස හා අමෝහ කුසල මූලයන් වේ. අකුසල සිතක් උපදින අවස්ථාවක කුසල සිතක් ඉපදීමේ හැකියාවක් නැත. එමෙන් ම කුසල සිතක් උපදින අවස්ථාවක අකුසල සිතක් ද ඉපදීමේ හැකියාවක් නැත. මුල් බුදුසමයාගත ඉගැන්වීම් අධ්‍යයනය කළ ථෙරවාද, සර්වාස්තිවාද හා සෞත්‍රාන්තික ගුරුකුල මේ පිළිබඳ විවිධ අදහස් දක්වා ඇත.

අකුසල සිතකින් අනතුරුව කුසල සිතක් උපදී නම් ඊට පෙරාතුව, එනම් එම සිතුවිලි දෙක අතර, භවංග සිතක් පහළ වන බව ථෙරවාදීහු පෙන්වා දෙති. සෞත්‍රන්තික ගුරුකුලය මේ සඳහා 'බීජ' යන්න හඳුන්වා දෙයි. චිත්ත-විප්‍රයුක්ත-සංස්කාර ධර්මයන් යටතේ එන 'ප්‍රාප්ති හා අප්‍රාප්ති' ධර්ම මේ කාර්ය ඉටුකරන බව සර්වාස්තිවාදීහු පෙන්වා දෙති. උපදින සිතුවල්ලට අනුරූපවන සිත් ඉපදීම සඳහා ප්‍රාප්තිය සහාය ලබා දෙන අතර ඊට ප්‍රතිවිරුද්ධ සිතුවිලි මැඩපැවැත්වීම සඳහා අප්‍රාප්තිය සහාය ලබා දෙන බව ඔවුන්ගේ අදහස යි.

මනස තුළ ක්‍රියාත්මක නොවී පවත්නා ප්‍රාථමික අකුසල ධර්ම අනුශය (අනුසය) නම් වේ. මෙලෙස ප්‍රාථමික අවස්ථාවේ පවතින අනුශය ධර්ම ඒ සඳහා සුදුසු අවස්ථාව පැමිණි පසු ක්‍රියාත්මක වේ. එවිට ඒවා පරියුට්ඨාන නම් වේ. සර්වාස්තිවාදී ගුරුකුලයට අනුව අනුශය ධර්ම චිත්ත-විප්‍රයුක්ත-සංස්කාර වන අතර පර්යවස්ථාන චිත්ත-සම්ප්‍රයුක්ත-සංස්කාර වේ. මේ අනුව, අනුශය ධර්මයනට පසුව කුසල සිතක් ඇති විය හැකි වුවත් පර්යවස්ථාන ධර්මයනට පසුව කුසල සිතක් ඇති නොවේ (ජයනි, 238 පිටුව).

සෞත්‍රාන්තික ගුරුකුලය මේ සඳහා 'බීජ' හඳුන්වා දෙයි. එනම්, කුසල බීජ, අකුසල බීජ හා අව්‍යාකත බීජ වශයෙනි. කුසල බීජ ක්‍රියාක්මක වන විට මනස කුසල සහගත වේ. අකුසල බීජ ක්‍රියාත්මක වන විට මනස අකුසල සහගත වේ. අව්‍යාකත බීජ ක්‍රියාත්මක වන විට මනස අව්‍යාකත වේ. මුල් බුදුසමයාගත ඉගැන්වීම් මූලික කර ගනිමින් මේ පිළිබඳ විමසා බැලීම මෙම ලිපියේ අරමුණයි.

පුද්ගලයා තුළ අනුශය වශයෙන් පවත්නා ප්‍රාථමික (නිද්‍රාශීල) අකුසල ධර්මයන් පවතී නම් එම සිතෙහි කුසල ධර්ම නො පිහිට යි. එබැවින් කුසල සිතක මෙහෙය වීමකින් තොර ව අනුශය වශයෙන් පවත්නා අකුසල ධර්ම ද මනසින් බැහැර කළ නො හැකිය. අනුශය ක්‍රියාත්මක වන විට එනම් පර්යවස්ථාන වන විට මනස අකුසල සහගත වේ.

ථෙරවාද අභිධර්මයෙහි අනුශය හතක් දක්වා ඇත. එනම්, කාමරාගානුසය, භවරාගානුසය, පටිඝානුසය, මානානුසය, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය, අවිජ්ජානුසය වශයෙනි. අභිධර්ම මාර්ගයෙහි 'කාරණයක් පැමිණි කල්හි නැගී ආ හැකි පරිදි සත්ත්ව සන්තානයෙහි යටපත් වී පවත්නා කාමරාගාදීහු අනුශය නම්' වන බව දක්වා ඇත (චන්දවිමල හිමි, 219 පිට).

මෙලෙස මනසෙහි ක්‍රියාත්මක වන ක්‍රියා හෙවත් සචේතනික කර්ම පිළිබඳ දීර්ඝ විස්තරයක් මහා කම්මවිභංග සූත්‍රයෙහි සඳහන් වේ. එහි සචේතනික ක්‍රියා තුනක් දක්වා ඇත (ම.නි. 3, 443-457 පිටු).

1. සචේතිනික අකුසල කර්ම
2. සචේතනික කුසල කර්ම
3. සචේතනික අව්‍යාකත කර්ම

උක්ත සූත්‍රාගත පැහැදිලි කිරීමට අනුව, යම් පුද්ගලයෙක් වර්තමාන ආත්මභාවයේ දී සිදු කරන ක්‍රියාව පමණක් මුල් කොට පරලොව පිළිබඳ තීරණය කිරීම නිවැරදි නොවන බව පෙන්වා දෙයි. ඒ බව පුද්ගලයන් හතර දෙනෙකු උපමා කොට පෙන්වා දී ඇත (ම.නි. 3, 444-457 පිටු). පහත වගුවෙන් එය පැහැදිලි වේ.

| | වර්තමාන ක්‍රියාව | අනාගත ඵලය | හේතුව |
|---|---|---|---|
| 1. | අකුසල් රැස්කරයි | අපාගත වෙයි | අකුසලය මැඩලන කුසලක්‍රියා ඉදිරිපත් වී නැත |
| 2. | අකුසල් රැස්කරයි | සුගතිගාමී වෙයි | කළ අකුසලය එම අවස්ථාවේ දී ඉදිරිපත් වී නැත |
| 3. | කුසල් රැස්කරයි | සුගතිගාමී වෙයි | කුසලය මැඩලන අකුසලක්‍රියා ඉදිරිපත් වී නැත |
| 4. | කුසල් රැස්කරයි | අපාගත වෙයි | කළ කුසලය එම අවස්ථාවේ දී ඉදිරිපත් වී නැත |

එම ඉගැන්වීමට අනුව, පුද්ගලයා තුළ අනුශය වශයෙන් පවත්නා ප්‍රාථමික අකුසල ධර්ම පවතී නම් එම සිතෙහි කුසල ධර්ම නො පිහිට යි. අනුශය වශයෙන් පවත්නා එම අකුසල ධර්ම මනසින් බැහැර කිරීම සඳහා කුසල සිතක මෙහෙය වීම අවශ්‍ය ය. මෙසේ අනුශය වශයෙන් පවත්නා අකුසල බීජ ක්‍රියාත්මක වන විට එනම් පර්යවස්ථාන වන විට මනස අකුසල සහගත වේ. ඒ අනුව, අකුසල ධර්මයන්ගෙන් සිත පාලනය කර කුසල ධර්ම වඩන (ආර්ය මාර්ගයෙහි ගමන්ගන්නා) පුද්ගලයාගේ හැර වෙනත් ඕනෑම පුද්ගලයකුගේ සිතෙහි අනුශය වශයෙන් පවත්නා අකුසල බීජ පවතින බව මහා මාලුඞ්ක්‍ය සූත්‍රයෙහි දක්වා ඇත.

දහරස්සහි මාලුඞ්ක්‍යපුත්ත කුමාරස්ස මන්දස්ස උත්තානසෙය්‍යකස්ස සක්කායොතිපි න හොති. කුතො පනස්ස උප්පජ්ජිස්සති සක්කායදිට්ඨී. අනුසේතිත්වෙවස්ස සක්කායදිට්ඨීානුසයෝ (ම.නි. 2, 164 පිටුව).

එහි විස්තර වන පරිදි, උඩුකුරුව සයනය කරන ළදරුවෙකුහට 'සක්කායදිට්ඨිය' යන්න පිළිබඳ අවබෝධයක් නැත. මක්නිසාද යත්, එම ළදරුවා සක්කායදිට්ඨිය යන්න කුමක්දැයි නො දන්නා හෙයිනි. එය ඕහට පැහැදිලි කිරීම ද දුෂ්කර ය. මේ අනුව, ළදරුවා මම ය, මාගේ ය යන අදහසින් එම මොහොතේ කටයුතු නො කළ ද එම සිත ඉපදීම සඳහා ඉවහල් වන දෑ ඔහුගේ

මනසෙහි නිරුපද්‍රිතව ඇත. ඒවා ක්‍රියාත්මක වන්නේ ඒ සඳහා උචිත, වර්ධනය වූ අවස්ථාවේ දී ය. කෙසේ නමුත්, ඔහුගේ සිතෙහි එම ධර්ම නිරුපද්‍රිතව පවත්නා ඕහට විෂය නො වෙයි. එනම්, එය අනුශය වශයෙන් පවතී. උදාහරණයක් ලෙස ඉන්ධන හුදකලාව පවතින තුරු දහනය නො වෙයි. මේ හේතු කොට ගෙන යමෙක් ඉන්ධන දහනය නො වේ යැයි පවසත් නම් එය මුලාවකි, මෝඩකමකි. මක්නිසාදයත්, ඉන්ධන දහනය වීම සඳහා අවශ්‍ය සාධක ලැබුණු විගස එය දහනය වන හෙයිනි. ඒ අනුව, යම් විටක ඉන්ධන ගින්දර සමග සම්මිශ්‍රණය වන්නේ ද එවිට දහනය වීම ආරම්භ වේ, හෙවත් ගින්න ඇති වේ. ළමා මනස ද එවැනි ය.

පුරිසින්ද්‍රියඤාණ සූත්‍රය ද අනුශය වශයෙන් පවත්නා අකුසල ධර්ම පිළිබඳ ව පුද්ගලයන් හය දෙනෙකු දක්වමින් විස්තර කරයි. එහි අතීත ක්‍රියා අනාගත ප්‍රතිඵල සඳහා හේතු වන අයුරු විස්තර කර ඇත.

| | වර්තමාන ක්‍රියාව - කුසල කර්ම | වර්තමාන ක්‍රියාව - අකුසල කර්ම | විනාශ නොවූ | ප්‍රතිඵලය | උපමාව |
|---|---|---|---|---|---|
| 1. | අතුරුදන් වෙයි | මතුවෙයි | කුසල මූල ඇත | කුසල් පහළ වේ | නො කඩ වූ විනාශ නො වූ බිත්තර වී මනා සේ සකස් කළ කුඹුරෙහි වැඩේ. |
| 2. | මතුවෙයි | අතුරුදන් වෙයි | අකුසල මූල ඇත | අකුසල් පහළ වේ | නො කඩ වූ විනාශ නො වූ බිත්තර වී ගලක් මත වපුරන්නේ ද එවිට එය නො වැඩේ. |
| 3. | අල්ප වශයෙන් හෝ නො වඩයි | රැස්කරයි | - | අපාගත වෙයි | කඩ වූ විනාශ වූ බිත්තර වී මනාසේ සකස් කළ කුඹුරෙහි වපුරන්නේ ද එවිට එය නො වැඩේ. |
| 4. | අතුරුදන් වෙයි | මතුවෙයි | කුසල මූල ඇත | කුසල මූල ද විනාශ වේ | කඩ වූ විනාශ වූ බිත්තර වී මනාසේ සකස් කළ කුඹුරෙහි වපුරන්නේ ද එවිට එය නො වැඩේ. |
| 5. | මතුවෙයි | අතුරුදන් වෙයි | අකුසල මූල ඇත | අකුසල මූල ද විනාශ වේ | තණ පිඩක දැල්වෙන අඟුරු ක්‍රමයෙන් වර්ධනය වේ. |
| 6. | බහුල වශයෙන් වඩයි | අල්ප වශයෙන් හෝ නො වඩයි | - | පිරිනිවෙයි | නිවුණු අඟුරු වියළි තණ පිඩක නොදැල්වේවේ. |

මෙහි දක්වා ඇති ප්‍රථම පුද්ගලයා සසර තුළ කුසල් කර්ම පුහුණු කොට ඇත. නමුත් වර්තමානයේ දී යම් හේතුවක් නිසා අකුසල කර්ම පුහුණු කරයි. එසේ වුව ද මොහු පූර්වයෙහි පුහුණු කළ කුසල ක්‍රියා හේතුවෙන් ඔහුගේ කුසල බීජ නිරුපද්‍රිතව පවතී. ඒ හේතුවෙන් ඔහු සැප විපාක ලබයි. යම්සේ නො කඩ වූ විනාශ නොවූ බීජ මනාසේ වපුළ කුඹුරෙහි වැඩෙන්නේ ද එසේ සැප විපාක ලබයි.

මේ අනුව, කුසල සිතක් උපදවාගැනීම සඳහා අකුසල සිත ප්‍රහාණය කළ යුතු බව මහා මාලුඞ්ක්‍ය සූත්‍රයේ දී බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙති. ඒ සඳහා උචිත භාවනාව සමථ භාවනාව යි.

සමථ භාවනාව යනු මනසෙහි විෂම ව පවත්නා ලෝභ, දෝස හා මෝහ සමතාවයට පත් කරන ක්‍රමවේද යයි. සමථයට පැමිණි විට තමා තුළ ක්‍රියාත්මක වන අකුසල ධර්ම තමාට ම හඳුනා ගැනීමට හැකි වේ. එනම්, ඔහු තමා තුළ ඇති පංච ඕරම්භාගීය ධර්ම හඳුනා ගනී. ඉන්පසු හෙතෙම මනස දියුණු කරගැනීම සඳහා විදර්ශනා භාවනාව වඩයි.

අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදො අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො, සක්කායදිට්ඨිපරියුට්ඨිතෙන චෙතසා විහරති. සක්කායදිට්ඨිපරෙතෙන, උප්පන්නාය ච සක්කායදිට්ඨියා නිස්සරණං යථාභූතං නප්පජානාති. තස්ස සා සක්කායදිට්ඨි ථාමගතා අප්පටිවිනීතා ඔරම්භාගියං සංයෝජනං, විචිකිච්ඡා ථාමගතා අප්පටිවිනීතා ඕරම්භාගියං සංයෝජනං (ම.නි. 2, 166 පිටුව).

''පුහුදුන් පුද්ගලයා බුද්ධාදී ආර්යයන් නො දකී. ආර්ය ධර්මය නො දනී. ආර්ය ධර්මයෙහි නො හික්මෙයි. සත්පුරුෂයන් නො දකී. සත්පුරුෂ ධර්මයෙහි නො හික්මෙයි. සක්කායදිට්ඨියෙන් යුතුව එම දෘෂ්ටියෙහි ම එල්බගනිමින් ඒ අනුව ම වාසය කරයි. තමා තුළ උපන් සක්කායදිට්ඨිය නැතිකරන ආකාරය නො දනී. එනිසා ඔහු තුළ සක්කායදිට්ඨිය ස්ථිර වෙයි'' යන්න මෙහි අදහස යි. මේ අනුව, පුහුදුන් පුද්ගලයාගේ සිත ගසක් මෙනි. ඔහු තුළ ඇති කුසල සිත මතු කරගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ගය පහත පරිදි පෙන්වා දී ඇත.

සෙය්‍යථාපි ආනන්ද මහතො රුක්ඛස්ස තිට්ඨතො සාරවතො තචං අච්ඡෙත්වා ඵෙග්ගුං අච්ඡෙත්වා සාරච්ඡේදො භවිස්සතීති නෙතං ඨානං විජ්ජති (ම.නි. 2, 168 පිටුව).

ස්ථිරව සිට වූ සාරවත් වූ මහා රුක්ෂයක පොත්ත නොසිඳ, එළය නොසිඳ අරටුව සිඳීම කළ නො හැකිය. යමෙක් මේ වෘක්ෂය සිඳිත් නම් ඔහු ප්‍රථමයෙන් පොත්ත සිඳිය යුතුය, දෙවනුව එළය සිඳිය යුතුය, තෙවනුව අරටුව සිඳිය යුතුය. මෙපරිදි පඤ්ච ඕරම්භාගීය සංයෝජන ප්‍රහාණය සඳහා ද මගක් ඇත. එනම්, කාමගුණයෙන් යුත් සියලු උපධි දුරු කොට, අකුසල ධර්ම වන නීවරණයන් ප්‍රහාණය කොට, කාමයෙන් වෙන් ව, අකුසල ධර්මයෙන් වෙන් ව, විතක්ක විචාර සහිත වූ විවේකයෙන් උපන් ප්‍රීතිය හා සුඛය ඇති ප්‍රථමධ්‍යානයනට පැමිණිය යුතුය. ඉන්පසු රූපා දී ධර්මයන් අනිත්‍ය, දුක්ඛ, අනත්ත වශයෙන් මෙනෙහි කළ යුතුය. ඉන්පසු හෙතෙම ආසවක්ඛය ඤාණය උපදවා නිවනෙහි සිත පිහිටුවයි.

අංගුත්තර නිකාය පභස්සර වග්ගයේ දී ප්‍රභාශ්වර මනස විස්තර කරයි. එහි දී මනස ප්‍රභාශ්වර බවත්, බාහිර ව පැමිණෙන උපක්ලේශ නිසා එය කිලිටි වන බවත්, එම බාහිර උපක්ලේශයන්ගෙන් ආරක්ෂා කරගත් විට එය පිරිසිදු වන බවත් පෙන්වා දෙයි.

පභස්සරිමිදං භික්ඛවේ චිත්තං. තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලිසේහි උපක්කිලිට්ඨං,
. . . ආගන්තුකෙහි උපක්කිලිසේහි විප්පමුත්තං (අ.නි. 1, 20 පිටුව).

මේ අනුව, සිත වනාහි කුඩා දිය කඩිත්තක (කුඩා පොකුණක) ඇති ජලය හා සමාන ය. මෙවන් ස්ථානයන්හි ඇති ජලය බැහැරින් පැමිණෙන උපද්‍රව කිසිත් නැති නම් ඉතා පැහැදිලි ය. එම

ජලය අවර්ණ ය. එවිට අපි එම ජලය ඉතා පිරිසිදු යැයි කියමු. නමුත් බැහැරින් කිසියම් වස්තුවක් හෝ ගලක් වැනි යමක් වැටුණු විට හෝ එය වහා අපිරිසිදු වේ. එහි ඇති ජලය එම දිය කඩිත්තෙහි ඇති මඩ, රොඩු ආදිය සමග මිශ්‍ර වී අවපැහැ ගනී.

අප මනස ද එවැනි ය. බැහැරින් එන කිසියම් උපක්ලේශක් (උපද්‍රවයක්) නැතිනම් එය ඉතා පිරිසිදු ය. ප්‍රභාශ්වර ය. මෙහි ප්‍රභාශ්වර සිත ලෙස හැඳින්වූයේ කෙලෙස් ධර්මයන්ගෙන් සම්පූර්ණයෙන් ම මිදුණු සිත නොවේ. රහතන් වහන්සේගේ සිත සියලු කෙලෙසුන්ගෙන් මිදී ඇත. එනම් ලෝභ, දෝස හා මෝහ යන අකුසල මූලයන් දුරුකොට ඇත. එම අකුසල මූලයන් හේතුවෙන් උපදනා සිත් උන්හන්සේට නැත. උන්වහන්සේ රාගය ක්ෂය කොට ඇත (රාගක්ඛයො). දෝසය ක්ෂය කොට ඇත (දොසක්ඛයො). මෝහය ක්ෂය කොට ඇත (මොහක්ඛයො). එනිසා එම සිතට කිසි විටකත් උපක්ලේශ නො පැමිණේ. නමුත් ප්‍රභාශ්වර සිතෙහි ලෝභ, දෝස හා මෝහ යන අකුසල මූලයන්ගෙන් උපදින උපක්ලේශ අනුශය වශයෙන් ක්‍රියාත්මක වේ.

මේ අනුව, මතු අවස්ථාවක මතුවිය හැකි එහෙත් මේ අවස්ථාවේ ක්‍රියාත්මක නොවන අකුසල මූලයන්ගෙන් සමන්විත සිත 'ප්‍රභාස්වර සිත' නම් වේ. ඉහතින් සඳහන් කළ පුරිසින්ද්‍රියඤාණ සූත්‍රය අනුසාරයෙන් ද මෙම ප්‍රභාස්වර සිතෙහි ස්වභාවය පහසුවෙන් වටහාගත හැකි ය. සිතෙහි මෙම ස්වභාවය හඳුන්වාදීම සඳහා අටුවාචාරීන් වහන්සේ යොදා ඇති නම 'භවංග' යන්න ය. 'අභිනව භවයෙහි උපන් පසු සිත් පරම්පරාව සිඳී යන්නට නො දී පැවැත්වීම භවාඞ්ග කෘත්‍යය' බව චන්ද්‍රවිමල හිමියෝ පෙන්වා දෙති (104 පිට). සත්ත්වයන්ට බහුල ව ඇති වන්නේ භවාඞ්ග සිත් ය. එහෙත් ඒවායේ ඇති වීම නො දැනේ (චන්ද්‍රවිමල හිමි, 105 පිටුව).

**සැ.යු.** මෙම ලිපියෙහි සඳහන් සියලු කරුණු පටිච්චසමුප්පාදයට අනුව අවබෝධ කර ගත යුතුය. නොයෙසේ නම් කිසියම් දෘෂ්ටියට වැටේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අංගුත්තරනිකාය, 1, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා.

මජ්ඣිමනිකාය, 2, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා.

මජ්ඣිමනිකාය, 3, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා.

චන්ද්‍රවිමල හිමි, රේරුකානේ. (2012). **අභිධර්ම මාර්ගය.** පොකුණුවිටඃ ශ්‍රී චන්ද්‍රවිමල ධර්මපුස්තක සංරක්ෂණ මණ්ඩලය.

Jaini, P.S., (2007). Collected Papers on Buddhist Studies. Delhi: Motilal Benarsidass.